# ළදරුවන්ගේ හමේ රෝග සියල්ල නසන රත කල්කය.



Dr ස්ටැන්ලි ධර්මකුමාර
ආයුර්වේද වෛද්‍ය විශේෂඥ
ජොතිෂ්‍ය විශාරද
සිද්ධාර්ථ ආයුර්වේද හා ජෝයතිශ්‍ය කාර්යාලය,

රත කල්කය යනු අපේ දේශයේ සංස්කෘතිකාංගය මව්කිරි මෙන්, රන්කිරි මෙන් රත කල්කයද එදා අපේ මව්වරුන් අලුත උපන් බිළිදාගේ මුව තැබුවේ මහත් සෙනෙහසිනි.

රතගාය යනු නවජාන දරුවන් කෙරෙහි මෙන්ම වැඩුනු බාලයන් කෙරෙහිද ඇතිවිය හැකි හමේ රෝග අවස්ථාවකි.

මෙය කාශ්‍යප සංහිතාවේ දක්වන චමීදල නැමැති රෝග අවස්ථාවට සමානය. දේශීය වෛද්‍යවරයා මෙම රෝග අවස්ථාව පිළිබඳ පැහැදිලි අවබෙ-ෝධයකින් යුතුව සිටි බව පෙනේ. බටහිර වෛද්‍ය විද්‍යාව අනුව සැලකීමේදී මෙම රෝග අවස්ථාව සමේ හටගත හැකි ජීවානුන්ගෙන් ඇතිවන රෝගයක් ලෙෂ දක්වයි. රතගාය යනු රක්තයේ (ලේවල) ඇතිවන ගාය යනු වේදනාව ආදී අර්ථයක් දෙයි. එනම් රක්ත සම්බන්ධතාවයක් ඇති රෝග අවස්ථාවක්ලෙස වචනාර්ථයෙන් පැහැදිලි වේ. ළදරුවන්ගේ සම රතු වී. දාහය, ශෝථ (ඉටදිමීම) වේදනා, හා කැසීම ආදී චර්මය හා සම්බන්ධ රෝග ලක්ෂණ සමූහයක් රථගාය යන්නෙන් හැදින්විය හැකිය.

රතගාය ඇතිවීමට හේතු සලකා බලමු.

**මවගේ හේතු.**

1 ගර්භනී සමය තුළ ඇඹුල් ආහාර, උෟෂ්ණ මස්මාංශ, මත්පැන්, දුම්පානය, හා තුනපහ අධික ආහාර ගැනීම.
2 මානසික අසහනය - අඹුසැමි ආරවුල්, තනිකඩ, ආර්ථික අගහිගකම්, රැකියාවල ගැටළු හා ණය බර, හා මානසික රෝග.
3 ආවේග - මල පහ කිරීම දරාසිටීම, නින්ද නොයෑම මුත්‍ර පහ කිරීම දරා සිටීම, සෙම හා දහඩිය පහ වීම වැලැක්වීම. අවේපාවට ජල ස්නානය, අධික උණුසුම් ජලය ස්නානය හා අධික වේලාවක් ජලය ස්නානය කිරීම.
4 ගර්භනී අවධියේ ඇතිවූ උණ, අධික වෙහෙස හා ශාරීරික වේදනා නිසා අපහසුතාවයන්
5 මවට ඇති වූ හමේ රෝග, කැසීම්, කුෂ්ඨ, දද හා සුදුකබර වැනි රෝග
6 ගර්භනී සමයේ නිසිලෙස කලට වෙලාවට ආහාර පාන නොගැනීම හා ආහාර අජීර්ණ වීම නිසාද වේ.
7 මවට දියවැඩියා රෝගය හෝ හමේ හෝ ලේවල රෝග හෝ අසාධ්‍ය පිළිකා හා ශල්‍යකම් සිදුකර තිබීම.
8 විවිධ වූ බටහිර ඖෂධ හා ආකල්ප වශී අනිසි පාවිච්චිය.

රතගායට ප්‍රතිකාර නොකර කල් ගතවූ විට ඇදුම ඇතිවීමට හැකිය. වයස 9-10 දක්වා වයස්ගත වන තෙක් රතගාය ඇති වීමට ඉඩ ඇත. රෝගියා පරීක්ෂා කර බලා වෛද්‍යවරයා නියම හමේ රෝග ලක්ෂණය හඳුනාගෙන වෙදකම් කළ යුතුයි. නැතිනම් පසුකලකදී හමේ පැල්ලම් ජීවිතාන්තය දක්වා පැවතිය හැකිය.

තවද, වකුගඩු ආබාධ, නොබසින උණ, හම රැලි බව හා අප්‍රසන්න වීම ඇතිවේ.

**රත කල්කය යනු කුමක්ද?**

රතු වර්ණයක නමකි, රෝගයකි කල්කය යනු අමු, පියලි, ඖෂධ අඹරා ගත් කල්කය නම්,

අලුත උපන් තම සියොමැලි බිලිදාට මව් කිරි වලට පරිබාහිරව යමක් දුන්නේ නම් ඒ රත කල්කය වේ.




මෙම රත කල්කය බිළිදුන් හමේ රක්ත පමනක්නොව, ලේ අපිරිසිදු වීම, සූතිශක්තික හොවත් රෝගවලට ඔරොත්තු දීම, හා පිටින් ශරීරයට බෝවන රෝග වලින් වැලකීමද හැකිය.

මෙම රත කල්කය සෑදීමට මා පෙළඹුනේ මගේ දිවංගත සීයා වන කලුබෝවිල පදිංචි කොරනේලිස් අප්පුහාමි වෙද ආරච්චි උතුමානන්ගේ අතින් ලියන ලද පුස්කොල පොතකින් උපුටාගෙන 1985 දී දිවංගත මහාචාර්යය ගුණපාල අමරසිංහ මහතා හා මගේද සහභාගීත්වයෙන් මෙම රත කල්කය සාදා පර්යේෂණ කර ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලබා ලොවට මෙම මහගු දිව්‍ය ඖෂධය ඉදිරිපත් කරමිනි.

මගේ ගුරු සීයාගේ පුස්කොළ පොතෙහි සඳහන් කවිපෙළ මගින් රත කල්කය මෙසේ විස්තර කර ඇත. (ක්‍රි.ව 181)

බිළිදුන් වදකර පැණිරස ඇති ලිය ලේවන් හිමෙක බර වන් සිඳුහට නඟමින් හරිබර වූ තැන ලිකුව යුෂින් අඹරා ගා උපටින් ළදරුව වලිප්පු උණ දුටු කොත්තමල්ලි තම්බාදෙනියකින් ගුණදෙන රහසකි. ඇදුරනි පෙර වෙද දන් පිඩද

**මෙම බෙහෙත් වට්ටෝරුව මෙසේය.**

බිළිඳුන් - කොල්ලු
සිදු - සහිඳ ලුණු
වදකර - වදකහ
ලිකුව යුෂ - දෙහි යුෂ
පැණිරස ඇතිලිය - වැල්මී
ලේවන් - රත් හදුන්
හිම - සුදු හඳුන්

යනු රත කල්කයේ අඩංගු ඖෂධයි.

රෝග ප්‍රබේද වෙන්කර ගැනීමේදී රථගාය සිරුර පුරා පැතිර යයි. ස්‍රාව සහිත මූණ ඇතිවේ දින 2-3 ක් පවතී විටෙක උණ හා වේදනා ඇතිවේ. නිතරම එක්තැනක ස්ථිරව නොපවතී. මේ නිසා දේශීය වෙදකමේ ද්‍රාවණ සහිත රථ නමින් හැදින්වේ. මෙය බටහිර වෛද්‍ය විද්‍යාවේ Erysipelas නමින් හදුන්වයි.

සමහර මවගේ පයොදරයේද විස ගෙඩි හට ගනී එය කිරි දෙන අවධියේ ඇතිවෙන නිසා දරුවාටද මෙම රෝගය ශරීරගතවේ. මෙය බටහිර වෛද්‍ය විද්‍යාවේ Brest Absces ලෙස දක්වයි.
තවද අරුංගිකා නමින් හදුන්වන, බෝහෝ සිදුරු සහිත ශ්‍රාවයෙන් යුක්ත වුණ හිසේ හට ගනී. මෙයි වේදනා අධික, හිසේ හමේ වේදනා පිපිරීම් සහිත ශ්‍රවයෙන් අධික අවස්ථාවකි. මෙය බටහිර වෛද්‍ය විද්‍යාවේ. Eczema of the Scalp ලෙස දක්වන අවස්ථාව වේ.

ළදරුවන්ගේ ශරීරයේ දුර්වල හා අඩුබර දරුවන්ට හා ලේවල රතු රුධිරානු අඩු දරුවන්ට හටගත් සම රතු වර්ණ වීම නිසා ඇතිවන රෝග ලකෂණ මනෝ දම් රතගාය නම්.

ළදරුවන්ගේ ශරීරයේ හමේ තැනින් තැන ලා පාට හටගන්නා සුදු පැල්ලම් සහිත වීම බඩවැල්වල හටගන්නා භාහිර විශබීජ නිසා ආහාර විෂ වීමෙන් පණු රත හටගනී.

රත කල්කය දරුවට දෙන අන්දම දරුවා ඉපදී සති 2 කට පසු එක දිගටම ෂතියක් දෙයි. ඊලග ෂතිය තුළ රත කල්කය නොදිය යුතුය. නැවතත් ඉන් පසු එන ෂතිය තුල දිගටම රත කල්කය දිය යුතුයි. ඉන් මාස 2කට පසු නැවත ෂතියක් රත කල්කය දිය යුතුයි.

ඉපදී දින 7 ක් ගතවූ දරුවාටත් රත කල්කය දෙන්න පුළුවන් දරුවට වසර දෙක පිරෙන තෙක් රත කල්කය දීම කළ හැකිය.

**දිය යුතු ප්‍රමාණය.**

කොත්තමල්ලි ඇටයක් 1 ප්‍රම්ණය දිනකට එක වරක්
වයස මාස 1 පසු කොත්ත මල්ලි කොත්තමල්ලි ඇට ප්‍රමාණයේ ගුලි 1 බැගින් දෙවරක් දෙන්න.
මෙම ගුලි කොත්තමල්ලි තැම්බූ වතුරෙන් හෝ මව් කිරි වලින් දීම ඉතාම ශුභයි.
රත කල්කය නොදිය යුතු අවස්ථා
උපන් බර අඩු දරුවන්ට වයසට නියමිත බර ඇතිවන තෙක් නොදිය යුතුයි.
අතීසාර හෝ මල බද්දය පෙළෙන අවස්ථාවලදී වමනය ඇති විට අගුණයි.

රත කල්කය සම්බන්ධයෙන් නවීන කාක්ෂණ ක්‍රම උපයෝගයෙන් සොයා ගත් විද්‍යාත්මක තොරතුරුද
1 ශරීර ගත වීමෙන් විෂ වීමක් ඇති නොවේ.
2 උණ අඩුකරයි.
3 බැක්ටීරියා හා අසාදන නාශක ගුණය සහිතයි.
4 දරුවන්ගේ ප්‍රතිශතීකරණ පද්දතිය වර්ධනය කරයි. Immunoglobulin ( 1gG, 1GA, 1GM) නිපදවී උත්තේජනය කරයි. රුධිරයේ Complementsc, C වැඩිකරයි.
5 ප්‍රදාහයක් නැති කරයි.

**රත කල්කය රත ගායට විතරද,**

නැත, වෙනත් රෝග සඳහාද දෙන්න පුළුවන්

කුඩා දරුවන්ට වැලදෙන උණ, වලිප්පුව, හතිය, මල බද්දය, උගුරේ සුදු බැදීම,(උල්ලෝ හම්) බඩ පිපුම, පණු වමනය, ශරීරයේ දැවිල්ල, මුත්‍ර දැවිල්ල ආදී රෝග අවස්ථාවලදීද දීමට හැකිය. වැඩිහිටි අයටද ඉතා ගුණ දායකයි. රක්ත පිත්ත, පිත්තාධික උෂ්ණ රෝග, ලේ විෂ වීම, අම්ලපිත්ත, හමේ රෝග, කුෂ්ඨ වලටද ඉතා ගුණයි.

රත කල්කය බීමෙන් පැහැපත් සමක් ලබා දෙයි.

හමේ රථගාය හෝ හමේ රෝග සඳහා රත කල ලබා ගැනීමට අවශ්‍ය නම් රෝගියා පරීක්ෂාක ර බලා සිද්ධාර්ත ආයුරුවේද වෛද්‍ය ජෝයතිෂ්‍ය කාර්යාලයෙන් පැමිණ මා හමුවී ලබා ගත හැකිය.